ජනාධිපති කාර්යාලය
1978-6-2

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 මැයි මස 26 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 40 යි    තැපැල් ගාස්තුව : ශත 15 යි

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන
(විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 23 වන දින]

එල්.ඩී.—ඕ. 34/78

ඇතැම වැරදි කිරීම සමබන්ධයෙන් භාර වෙන්නා වූ හෝ ඉදිරිපත් කරනු ලබන්නා වූ හෝ තැනැත්තන් ඇතැම අධිකරණ විසින් ඇප පිට නිදහස් කිරීම තහනම කිරීම හෝ සීමා කිරීම පිණිස ද එවැනි වැරදි සමබන්ධයෙන් වරදකරු කරනු ලැබූ හෝ වරදකරු වූ හෝ තැනැත් තන්ට අත්හිට වූ සිර දඬුවම නියම කිරීම සහ එම තැනැත්තන් කොන් දේසි පිට නිදහස් කිරීම තහනම කිරීම පිණිස ද එවැනි වැරදි සඳහා අවම දඬුවමක් නියම කිරීමට විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** වෙනත් යම ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද— *යම ලිඛිත නීතියක ඇපදීම පිළිබඳ වූ විධිවිධාන ඇතැම වැරදි කිරීම සමබන්ධයෙන් භාර වෙන්නා වූ නැතහොත් ඉදිරිපත් කරනු ලබන්නා වූ තැනැත්තන් සමබන්ධයෙන් අදාළ නොවිය යුතු බව.*

(අ) මෙහි පළමුවන උපලේඛනයෙහි දැක්වෙන යම වරදක් කොට ඇති බවට වූ හෝ කිරීමෙහි ලා සමබන්ධ වී ඇති බවට වූ හෝ වරදක් කොට ඇති බවට හෝ කිරීමෙහි ලා සමබන්ධ වී ඇති බවට සැක කිරීමෙහි ලා වූ හෝ දෝෂාරෝපණයක් මත යම තැනැත්තකු භාර වන්නේ හෝ අත්අඩංගුවට ගනු ලැබ ඉදිරිපත් කරනු ලබන්නේ යම අධිකරණයක් ඉදිරියෙහි ද ඒ සෑම අධිකරණයක් විසින් ම නඩු විභාගය අවසන් වන තුරු එම තැනැත්තා සිරභාරයෙහි තබා ගත යුතු ය ;

(ආ) මෙහි දෙවන උපලේඛනයෙහි දැක්වෙන යම වරදක් කොට ඇති බවට වූ හෝ කිරීමෙහි ලා සමබන්ධ වී ඇති බවට වූ හෝ වරදක් කොට ඇති බවට හෝ කිරීමෙහි ලා සමබන්ධ වී ඇති බවට සැක කිරීමෙහි ලා වූ හෝ දෝෂාරෝපණයක් මත යම තැනැත්තකු භාර වන්නේ හෝ අත් අඩංගුවට ගනු ලැබ ඉදිරිපත් කරනු ලබන්නේ යම අධිකරණයක් ඉදිරියෙහි ද ඒ සෑම අධිකරණයක් විසින් ම, ඔහු භාර වන්නේ නැතහොත් ඉදිරිපත් කරනු ලබන්නේ යම අධිකරණයක් ඉදිරියෙහි ද ඒ අධිකරණය විසින්, ඔහු ඇප පිට නිදහස් කිරීම පිළිබඳව හේතු වාර්තාගත කිරීමෙන් පසුව ඔහු නිදහස් කරනු ලැබිය හැකි විශේෂ අවස්ථාවල දී හැර, නඩු විභාගය අවසන් වන තුරු එම තැනැත්තා සිරභාරයෙහි තබා ගත යුතු ය ; තව ද

(ඇ) මෙහි පළමුවන උපලේඛනයෙහි නැතහොත් දෙවන උපලේඛන යෙහි දැක්වෙන යම වරදක් සමබන්ධයෙන් යම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කිරීමට හෝ ඔහුට නියම කරන ලද දණ්ඩන නියමයට හෝ විරුද්ධව අභියාචන පෙත්සමක් ඉදිරිපත් කර ඇත්තේ වුව ද අභියාචනය තීන්දු කරනු ලබන තුරු එම තැනැත්තා සිරභාරයෙහි තබා ගත යුතු ය :

එසේ වුව ද විශේෂ අවස්ථාවල දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, (අ), (ආ) හෝ (ඇ) ඡේදයෙහි සඳහන් යම තැනැත්තකු ඇප පිට නිදහස් කරනු ලැබිය හැකි ය.

2—ජ 34384—11,701 (78/05)

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ ඇතැම් දඬුවම්වලට අදළ විධිවිධාන ඇතැම් වැරදි සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ හෝ වරද කරු වූ හෝ තැනැත්තන්ට අදළ නොවිය යුතු බව.

3. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ කුමක් සඳහන් ව ඇත ද, මෙහි පළමුවන උපලේඛනයෙහි නැතහොත් දෙවන උපලේඛනයෙහි දක්වෙන යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් හෝ යම් අධිකරණයක් ඉදිරියෙහි දී—

(අ) වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ඒ පනතේ 239 වන වගන්තියේ විධිවිධාන අදළ නොවිය යුතු ය ;

(ආ) වරද පිළිගත්තා වූ හෝ වරදකරු යයි තීරණය කරනු ලැබූ හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ඒ පනතේ 250 වන වගන්තියේ විධිවිධාන අදළ නොවිය යුතු ය.

අවම දඬුවම නියම කිරීම.

4. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද—

(අ) බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි, මෙහි පළමුවන උපලේඛනයෙහි නැතහොත් දෙවන උපලේඛනයෙහි දක්වෙන යම් වරදකට යම් තැනැත්තකු වරදකරු කරන සෑම අධිකරණයක් ම, ඒ අධිකරණයේ දඬුවම් පැමිණවීමේ සාමාන්‍ය බලතල කුමක් වුව ද, එම අධිකරණය විසින් එම වරද සම්බන්ධයෙන් නීත්‍යානුකූලව නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව, එම වරද සම්බන්ධයෙන් ඔහුට නියම කරනු ලැබිය හැකි බන්ධනාගාරගත කිරීමේ උපරිම කාලසීමාවෙන් තුනෙන් එකකට නොඅඩු කාලසීමාවක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනයක දී හෝ ප්‍රතිශෝධනයක දී මෙහි පළමුවන උපලේඛනයෙහි නැතහොත් දෙවන උපලේඛනයෙහි දක්වෙන වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කිරීම ඉවතලනු ලැබේ නම් මිස, එම වරද සම්බන්ධයෙන් එම තැනැත්තාට නියම කරනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය ඉවත ලෑම හෝ එම වරද සම්බන්ධයෙන් ඔහුට නියම කරනු ලැබිය හැකි බන්ධනාගාරගත කිරීමේ උපරිම කාලසීමාවෙන් තුනෙන් එකකට වඩා අඩු කාලසීමාවක් සඳහා වූ දණ්ඩන නියමයක් ආදේශ කිරීම හෝ නොකළ යුතු ය.

උපලේඛනවල දක්වෙන වරදවල් සම්බන්ධයෙන් වූ නඩු සහ ඒවාට වරදකරු කිරීම සම්බන්ධයෙන් වූ අභියාචනා විභාග කිරීමට ප්‍රමුඛත්වය දිය යුතු බව.

5. මෙහි පළමුවන උපලේඛනයෙහි නැතහොත් දෙවන උපලේඛනයෙහි දක්වා ඇති යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නගනු ලැබූ හෝ අධිචෝදනා නගනු ලැබූ යම් තැනැත්තකු පිළිබඳ නඩු විභාග කිරීම සහ එවැනි යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කිරීමකට සහ එවැනි වරද කරු කිරීමක් මත නියම කරන ලද දණ්ඩන නියමයකට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් විභාග කිරීම සම්බන්ධයෙන් සෑම අධිකරණයක් ම ප්‍රමුඛත්වය දිය යුතු ය.

**6.** ශ්‍රේෂ්ඨාධිකරණය ලවා මෙ පනතේ විධිවිධාන යටතේ එම අධිකරණයේ බලතල ක්‍රියාත්මක කරවා ගනු පිණිස යම් තැනැත්තකු විසින් එම අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමකට නීතිපතිවරයා පාර්ශ්වකරුවකු කළ යුතු ය.

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන යම් ඉල්ලීමකට නීතිපතිවරයා පාර්ශ්වකරුවකු කළ යුතු බව.

**7.** මෙ පනත ආරම්භ වන දිනයට පෙර සිදු කරනු ලැබුවා වූ ද මෙහි 'පළමුවන උපලේඛනයෙහි දක්වෙන්නා වූ ද පහත දක්වෙන වැරදිවලට ද මෙ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය :—

දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය
දණ්ඩ නීති සංග්‍රහයේ 383 වන වගන්තිය
දණ්ඩ නීති සංග්‍රහයේ 384 වන වගන්තිය
1966 අංක 18 දරන පිධාකාරී ආයුධ පනතේ 2 වන, 3 වන, 4 වන, 5 වන හා 6 වන වගන්ති.

මෙ පනත ආරම්භ වන දිනයට පෙර කරනු ලැබූ ඇතැම් වැරදිවලට මෙ පනත අදාළ විය යුතු බව.

**8.** මෙ පනතෙහි විධිවිධාන මෙ පනත ආරම්භ වන දින සිට එක් අවුරුදු කාලයක් ක්‍රියාත්මක විය යුතු ය.

මෙ පනත වලංගුව පවත්නා කාලය.

## පළමුවන උපලේඛනය

| අදාළ විය යුතු ප්‍රඥප්ති සහ වගන්ති | වරදෙහි ස්වභාවය |
|---|---|
| 1. දණ්ඩ නීති සංග්‍රහයේ 114 වන වගන්තිය | රජයට විරුද්ධව යුද්ධ කිරීම හෝ යුද්ධ කිරීමට තැත් කිරීම හෝ යුද්ධ කිරීමට අනුබල දීම. |
| 2. දණ්ඩ නීති සංග්‍රහයේ 115 වන වගන්තිය | රජයට විරුද්ධව යුද්ධ කිරීමට කුමන්ත්‍රණය කිරීම. |
| 3. දණ්ඩ නීති සංග්‍රහයේ 116 වන වගන්තිය | යුද්ධ කිරීමේ චේතනාවෙන් ආයුධ යනාදිය එකතු කිරීම. |
| 4. දණ්ඩ නීති සංග්‍රහයේ 117 වන වගන්තිය | යුද්ධ කිරීමේ සැලැස්මක් තිබීම වසන් කිරීම. |
| 5. දණ්ඩ නීති සංග්‍රහයේ 119 වන වගන්තිය | යම් නීත්‍යානුකූල බලයක් ක්‍රියාත්මක කිරීමට බල කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීම වැළැක් වීමේ හෝ චේතනාවෙන් රජයේ ප්‍රධානියාට හෝ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකුට හෝ පහර දීම. |
| 6. දණ්ඩ නීති සංග්‍රහයේ 191 වන වගන්තිය | මරණ දඬුවම දිය හැකි වරදකට වරදකරු බවට පත් කිරීමේ චේතනාවෙන් බොරු සාක්ෂිදීම හෝ බොරු සාක්ෂි ගෙතීම. |
| 7. දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය | මිනී මැරුම. |
| 8. දණ්ඩ නීති සංග්‍රහයේ 380 වන වගන්තිය | ඉර බැසීම සහ ඉර නැගීම අතර කාලය තුළ මහා මාර්ගයේ දී කරනුලබන කොල්ලකෑම. |
| 9. දණ්ඩ නීති සංග්‍රහයේ 383 වන වගන්තිය | මරණය හෝ බරපතල තුවාල හෝ සිදු කිරීමට තැත් කිරීමත් සමඟ කොල්ලකෑම. |
| 10. දණ්ඩ නීති සංග්‍රහයේ 384 වන වගන්තිය | මාරක ආයුධයකින් සන්නද්ධව කොල්ලකෑමට තැත් කිරීම. |
| 11. දණ්ඩ නීති සංග්‍රහයේ 385 වන වගන්තිය | තැනින් තැන යන සොරු කණ්ඩායමකට අයත්වීම. |

| අදාළ විය යුතු ප්‍රඥප්ති සහ වගන්ති | වරදෙහි ස්වභාවය |
|---|---|
| 12. දණ්ඩ නීති සංග්‍රහයේ 101 සිට 113ආ දක්වා වූ (ඒ වගන්ති දෙක ද ඇතුළත්) වගන්ති | මේ උපලේඛනයෙහි දැක්වෙන යම් වරදක් කිරීමට අනුබලදීම, කුමන්ත්‍රණය කිරීම යනාදිය. |
| 13. 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනතේ 2 වන වගන්තිය | පිඩාකාරී ආයුධ ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, සන්තකයෙහි තබා ගැනීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, සැපයීම සහ අත්කර ගැනීම යනාදිය. |
| 14. 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනතේ 3 වන වගන්තිය | පිඩාකාරී ආයුධ පාවිච්චි කිරීමෙන් දේපළවලට කරනු ලබන අලාභය සහ විනාශය යනාදිය. |
| 15. 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනතේ 4 වන වගන්තිය | පිඩාකාරී ආයුධවලින් තුවාල සිදු කිරීම හෝ පිඩාකාරී ආයුධවලින් මරණය නැතහොත් තුවාල සිදු කිරීමට තැත් කිරීම. |
| 16. 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනතේ 5 වන වගන්තිය | 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනත යටතේ වැරදි කිරීමට තැත් කිරීම. |
| 17. 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනතේ 6 වන වගන්තිය | 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනත යටතේ වැරදිවලට අනුබල දීම. |
| 18. තුවක්කු ආඥා පනතේ 22 වන වගන්තිය | බලපත්‍ර නොමැති තුවක්කු තම සන්තකයෙහි තබා ගැනීම. |

## දෙවන උපලේඛනය

| අදාළ විය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති | | වරදෙහි ස්වභාවය |
|---|---|---|
| 1. 120 වන වගන්තිය | ... | නීත්‍යනුකූල මාර්ගවලින් හැර වෙනත් ආකාරයකින් ආණ්ඩුව කෙරෙහි අප්‍රසාදය ඇවිස්සීම හෝ ඇවිස්සීමට තැත් කිරීම හෝ විවිධ පන්ති අතර සතුරු හැඟීම් වර්ධනය කිරීම. |
| 2. 300 වන වගන්තිය | ... | මිනී මැරීමට තැත් කිරීම. |
| 3. 371 වන වගන්තිය | ... | සොරකමක් කිරීම සඳහා මරණය නැතහොත් තුවාල සිදු කිරීමට සූදානම්වීමෙන් පසු සොරකම් කිරීම. |
| 4. 373 වන වගන්තිය | ... | ත්‍රාසාද්ග්‍රහණය. |
| 5. 380 වන වගන්තිය | ... | ඉර බැසීම සහ නැගීම අතර කාලය තුළ මහා මාර්ගයේ දී කරනු ලබන කොල්ලකෑමක් නොවන කොල්ලකෑමක්. |
| 6. 381 වන වගන්තිය | ... | කොල්ලකෑමට තැත් කිරීම. |
| 7. 382 වන වගන්තිය | ... | කොල්ලකෑම සිදු කිරීමේ දී ස්වේච්ඡාවෙන් තුවාල කිරීම. |
| 8. 395 වන වගන්තිය | ... | පුරුද්දක් වශයෙන් සොර බඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| 9. 418 වන වගන්තිය | ... | රුපියල් එක් සියයක හෝ ඊට වැඩි ප්‍රමාණයක අලාභයක් සිදු කිරීමේ චේතනාවෙන් ගින්නෙන් හෝ පුපුරණ ද්‍රව්‍යයකින් අනර්ථයක් සිදු කිරීම. |
| 10. 419 වන වගන්තිය | ... | පූජනීය ස්ථානයක් ලෙස හෝ මනුෂ්‍ය වාසස්ථානයක් ලෙස හෝ දේපළ ආරක්ෂා සහිතව තැබීම සඳහා වූ ස්ථානයක් ලෙස හෝ සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන ගෙයක් විනාශ කිරීමේ චේතනාවෙන් ගින්නෙන් හෝ පුපුරණ ද්‍රව්‍යයකින් අනර්ථයක් සිදු කිරීම. |

| අදාළ විය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති | | වරදෙහි ස්වභාවය |
|---|---|---|
| 11. 420 වන වගන්තිය | ... | කටවු සහිත යාත්‍රාවක් හෝ ටොන් දහයක් නැතහොත් ඊට වැඩි ප්‍රමාණයක බර පැටවිය හැකි යාත්‍රාවක් හෝ විනාශ කිරීමේ හෝ එය ආරක්ෂා රහිත බවට පත් කිරීමේ චේතනාවෙන් අනර්ථයක් සිදු කිරීම. |
| 12. 426 වන වගන්තිය | ... | මරණය හෝ තුවාල හෝ සිදු කිරීම සඳහා සූදානම්වීමෙන් පසු අනර්ථයක් සිදු කිරීම. |
| 13. 440 වන වගන්තිය | ... | බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් කිරීම සඳහා රැක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම. |
| 14. 441 වන වගන්තිය | ... | යම් තැනැත්තකුට තුවාල සිදුකිරීම සඳහා සූදානම්වීමෙන් පසු රැක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම හෝ ගෙවල් බිඳීම. |
| 15. 442 වන වගන්තිය | ... | රාත්‍රියෙහි රැක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම හෝ රාත්‍රියෙහි ගෙවල් බිඳීම. |
| 16. 443 වන වගන්තිය | ... | වරදක් කිරීම සඳහා රාත්‍රියෙහි රැක සිට ගෙයකට ඇතුළුවීම හෝ රාත්‍රියෙහි ගෙවල් බිඳීම. |
| 17. 444 වන වගන්තිය | ... | යම් තැනැත්තකුට තුවාල සිදු කිරීම සඳහා සූදානම් වීමෙන් පසු රාත්‍රියෙහි රැක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම හෝ රාත්‍රියෙහි ගෙවල් බිඳීම. |
| 18. 445 වන වගන්තිය | ... | රැක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළුවීමේ දී හෝ ගෙවල් බිඳීමේ දී බරපතල තුවාල සිදු කිරීම. |
| 19. 446 වන වගන්තිය | ... | රාත්‍රියෙහි රැක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළුවීමකට හෝ රාත්‍රියේ ගෙවල් බිඳීමකට එක්ව සම්බන්ධවූනු තැනැත්තන්ගෙන් එක් අයකු විසින් මරණය හෝ බරපතල තුවාල සිදු කිරීම. |
| 20. 490 වන වගන්තිය | ... | බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි ඉහත සඳහන් යම් වරදක් කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් දඬුවම් කිරීමට ප්‍රකාශිතව ම විධිවිධාන සලසා නොමැති අවස්ථාවක එවැනි යම් වරදක් කිරීමට තැත් කිරීම. |
| 21. 101 සිට 113ආ දක්වා වූ (ඒ වගන්ති දෙක ද ඇතුළත්) වගන්ති. | | මේ උපලේඛනයෙහි සඳහන් යම් වරදක් කිරීමට අනුබලදීම, කුමන්ත්‍රණය කිරීම යනාදිය. |